රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 7/92

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 පෙබරවාරි මස 18 වෙනි දින.

**සියලුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්රුන්,
පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසාපතිවරුන් හා
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල
සභාපතිවරුන්.

**රජයේ වාහන පෞද්ගලික කටයුතු සඳහා පාවිච්චි කිරීම.**

1984.08.15 දින අංක. 264 සහ 1988.02.11 දින අංක. 6/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට ඔබේ අවධානය යොමු කරවමි.

02. මෙම චක්‍රලේඛ අනුව එහි සඳහන් නිලධාරි කොටස්වලට රාජකාරි වාහන පෞද්ගලික කටයුතු සඳහා පාවිච්චි කිරීමේ අනුග්‍රහයන් පහත සඳහන් පරිදි ලබා දී ඇත.

I. මසකට රු. 150/=ක ගෙවීමක් මත පෞද්ගලික ගමන් සඳහා අංක. 264 රා.පරි. චක්‍රලේඛයේ 01 ජේදයේ සඳහන් කොටස්වලට.

II. මසකට රු.100/=ක ගෙවීමක් මත සැතපුම් 600ක පෞද්ගලික ධාවනය හෝ මසකට ඉන්ධන ගැලුම් 24ක ප්‍රතිපාදනයක්: අංක. 264 චක්‍රලේඛයේ 02 ජේදයේ සඳහන් කොටස්වලට හා අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මෙම අනුග්‍රහය ලබා දී ඇති වෙනත් නිලධාරියෙක්.

III. නිවසේ සිට කාර්යාලයට සහ ආපසු ගමන් කිරීමේ පහසුකම.

IV. අංක. 264 දරණ රා.පරි.චක්‍රලේඛයේ 07 ජේදය අනුව විශේෂ අනුමැතිය මත මෙම අනුමැතිය දිය යුත්තේ විශේෂ අවස්ථාවන්හි දී පමණක් විය යුතු අතර, එවැනි එක් එක් අවස්ථාව සඳහා වෙන වෙනම අනුමැතිය ලබාදිය යුතු බව විශේෂයෙන් සටහන් කරගත යුතුය.

( ඉහත (I) සහ (II) යටතේ වන අනුග්‍රහයන් ප්‍රතිපත්ති සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයෙන් පනවා ඇති ඉන්ධන ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව විය යුතුය.)

03. පෞද්ගලික කටයුතු සඳහා හෝ නිවසේ සිට කාර්යාලයට පැමිණීමට වෙනත් නිලධාරියෙක් රජයේ වාහන පාවිච්චි කරන්නේ නම්, එය රජයේ භාණ්ඩ අයථා ලෙස පරිහරණ කළා සේ සැළකිය යුතු අතර, ඒ සම්බන්ධව තදින් ක්‍රියා කළ යුතුය.

04. රියැදුරන් කාර්යාලවල නැවතී සිටින අතර, සමහර නිලධාරීන් රජයේ වාහන පදවන බව අවධානයට යොමු කර තිබේ. අංක.6/88 රා.පරි.චක්‍රලේඛයේ 04 වන ඡේදයේ සඳහන් නිලධාරීන් හා අංක.264 දරණ රා.පරි.චක්‍රලේඛයේ 08 වන ඡේදය අනුව විශේෂ අවස්ථාවන්හි දී විශේෂ අනුමැතිය ලබාගත් නිලධාරීන්ට පමණක් රාජකාරි වාහන පැදවීමට ඉඩ දී ඇති බව කරුණාකර සටහන් කරගන්න. අංක. 264 රා.පරි. චක්‍රලේඛයේ 10 වැනි වගන්තියේ සඳහන් පරිදි ඒ සම්බන්ධයෙන් වගකීමක් දරණ ලේකම්වරුන් විසින් මෙම කොන්දේසි කඩ කරන නිලධාරීන් සම්බන්ධයෙන් තදින් ක්‍රියා කළ යුතුය.

05. මෙම වාහන පෞද්ගලික පාවිච්චිය සඳහා දී තිබුණ ද, මේවා රජයට අයත් වාහන බව අවධාරණය කළයුතුව ඇත. රා.පරි.චක්‍රලේඛ අංක. 5/90 යටතේ මනාපය ප්‍රකාශ කර නොමැති නම්, එවැනි වාහන නිශ්චිත නිලධාරියා පාවිච්චි නොකරන අවස්ථාවල දී වෙනත් නිලධාරීන්ගේ පාවිච්චිය සඳහා දිය යුතුය.

06. වාහනයේ ලියාපදිංචි අංකයක් සමඟ එය වෙන් කළ නිලධාරියාගේ නම සහ එම පාවිච්චිය සඳහා අනුමැතිය ( රා.පරි.චක්‍රලේඛය, අමාත්‍ය මණ්ඩල තීරණය ආදිය) සමඟ තම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වාගෙන යන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණවල දී විගණන නිලධාරීන්ට මෙය ලබාදීමට සැලැස්විය යුතුය. රජයේ වාහන පෞද්ගලික පාවිච්චිය සඳහා වන අනුග්‍රහය හිමි අයට පමණක් එසේ පාවිච්චි කිරීමට ඉඩදීම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වගකීම වේ.

07. රා.පරි.චක්‍රලේඛ 5/90 යටතේ මනාපය පළ කළ හැක්කේ ඉහත සඳහන් 02 ඡේදයේ සහ (II) වගන්ති යටතේ ගැනෙන නිලධාරීන්ට පමණකි. එවැනි නිලධාරීන් ආයතනයේ සංචිත වාහන පාවිච්චි නොකළ යුතුය.

මෙම කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් තදින් ක්‍රියා කළ යුතුය.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

පිටපත:- විගණකාධිපති - දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා.